**GMOA** ESTABLISHED IN 1926 TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

25/11/2013

## මාධ්‍ය නිවේදනය

**පිළිගත් වෛද්‍ය පාඨමාලාවක් සම්පූර්ණයෙන් හදාරන්නේ නැතිව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියා පදිංචි විය නොහැක.**

ඇපෝතිකරිවරුන් වෛද්‍යවරු ලෙස පෙනී සිටිමින් ශ්‍රී ලංකාව තුල සේවයේ යෙදෙන සීමිත අධ්‍යාපන පසුබිමක් සහිත සෞඛ්‍ය සේවක පිරිසකි. ඔවුන් විවිධ අවස්ථාවල පවතින රජයන් නොමග යවමින් පියවරෙන් පියවර රාජ්‍ය සේවයේ පිළිගැනීමක් ලබා ගත්හ. සුදුසකම් ලත් වෛද්‍යවරුන් ලෙස සමාජයේ පෙනී සිටියහ.

1998 වර්ෂයේදී ඇපෝතිකරවරුන්ට වෛද්‍යවරුන් වීමට සිතක් පහල විය. ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යංශය රුසියාවේ ශාන්ත පිටර්ස්බර්ග් විශ්ව විද්‍යාලයේ වෛද්‍ය උපාධිය ලබා ගැනීමට සැලසුම් සකස් කර දෙන ලදී. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා වසර 03ක වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා දීමට එවකට සිටි සෞඛ්‍ය අමාත්‍යාංශ දේශපාලකයින් පියවර ගත්හ.

නමුත් මෙම ඇපෝතිකරිවරුන් මෙම වෛද්‍ය පාඨමාලා හැදෑරීම වෙනුවට ලංකාවේම රැඳී සිටිමින් සම්පූර්ණ නිවාඩු කාලය තුලම පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුනි. මෙසේ නිවාඩු ලබා දීම වෙනත් කිසිඳු රාජ්‍ය සේවකයෙක් නොලබන වරප්‍රසාදයකි.

අවුරුදු 03ක කාලය අවසානයේදී, මොවුන් වෛද්‍ය පාඨමාලාව සම්පූර්ණ කල බවට ව්‍යාජ සහතිකයන් ඉදිරිපත් කර වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ඉල්ලා සිටියහ.

නමුත්, වෛද්‍ය සභාවේ ලේකාධිකාරීව සිටි මහාචාර්ය පි එස් එස් පණ්ඩිතරත්න මහතා මෙම වංචාව අනාවරණය කරන ලදී. රුසියන් උපාධි සහතිකයේ වසර 3ක නේවාසික ලෙස සඳහන්ව ඇතත් මෙම ඇපොතිකරිවරුන්ගේ ගමන් බලපත්‍රය අනුව රුසියාවට ගොස් ඇත්තේ අවුරුදු 03ක් සඳහා නොව සති 02 සිට මාස 06ක කාලයක් පමණක් බවක් අනාවරණය වුණි. මෙය වංචාවකි.

රජයේ මුදල් අපහරණය පරිශිෂ්ඨ 1 යටතේ ඇති බරපතල වරදකි. රජයේ මුදල් අපහරණය නිසා දෙපාර්තුමේන්ත පරීක්ෂණයක් පවත්වා ඔවුන්ට දඬුවම් කල යුතුය. පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රහස් වාර්තාවක් මගින් මෙම වංචා තවදුරටත් තහවුරු කර ඇත. නමුත් මෙම පිරිස ව්‍යාජ රුසියානු උපාධියට වෛද්‍ය ලියාපදිංචිය අයදුම් කර ඇත. අවස්ථා දෙකකදීම ශ්‍රේෂ්ඨාධිකරණය එම නඩුව බැහැර කරන ලදී.

අප සංගමය රටේ ඕනෑම පුරවැසියෙක් වෛද්‍යවරයෙක් වීමට විරුද්ධ නැත. නමුත් වෛද්‍යවරයෙක් වීමට ඇත්තේ එක මාවතකි. එනම් පිළිගත් වෛද්‍ය විද්‍යාලයකින් වෛද්‍ය උපාධියක් හිමි කර ගැනීමයි. වංචනිකයන්ට වෛද්‍යවරු ලෙස පෙනී සිටීමට ලියාපදිංචිය ලබාදීම පොදුවේ සියලු පුරවැසියන්ට භයානක ඉරණමක් ඇති කරන, මෙරට වෛද්‍යවරුන්ගේ ප්‍රමිතිය පහත හෙලන පියවරකි.

මුදලට උසස් අධ්‍යාපනය, වෛද්‍ය උපාධිය පාවා දීමට මෙම ඉහල නිලධාරීන් කටයුතු කිරීම අභාග්‍යයකි. තමන්ට ලැබෙන තාවකාලික වරප්‍රසාද රැකගැනීමට තම වගකීම් හා තනතුරේ ගෞරවය බාල්දු වන අයුරින් කටයුතු කිරීම රටේ අවාසනාවකි.

කලයුතුව ඇත්තේ රජයේ මුදල් අපහරණ යටතේ වහාම පරීක්ෂණ ආරම්භ කර දඬුවම් පැමිණවීමයි.

ස්තූතියි,

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර -

| | |
|---|---|
| වෛද්‍ය නලින් ආරියරත්න | - 0714800942 |
| වෛද්‍ය නලින්ද හේරත් | - 0717876516 |
| වෛද්‍ය නවීන් ද සොයිසා | - 0718582444 |